MARKETING MANAGEMENT (Part-V)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

නිෂ්පාදිත

මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම සඳහා වෙළෙඳ පොළට ඉදිරිපත් කළ හැකි කවර ම හෝ දෙයක් නිෂ්පාදිත ලෙස හැඳින්විය හැකි ය. නිෂ්පාදිත පහත සඳහන් ලෙස වර්ගීකරණය කළ හැක.

ClassWork.LK

නිෂ්පාදිත වර්ගීකරණය



ClassWork.LK

පාරිභෝගික භාණ්ඩ - Consumer Goods

එදිනෙදා පරිභෝජනයට යොදා ගනී. බොහෝ විට පාරිභෝගික භාණ්ඩ භාවිතයෙන් කෙළවර වේ. මෙම භාණ්ඩ අලෙවිකරුවකුගේ දෘෂ්ටිකෝණයෙන් ප්‍රධාන භාණ්ඩ වර්ග හතරක් පෙන්වා දිය හැකි ය.

අලෙවිකරුවකුගේ දෘෂ්ටිකෝණයෙන් පාරිභෝගික භාණ්ඩ වර්ගීකරණය

1. පහසු භාණ්ඩ - Convenience Goods

පාරිභෝගිකයා නිරන්තරයෙන් මිලදි ගන්නා භාණ්ඩ වේ.

නිදසුන් :

සබන්, දන්තාලේප, පැන්, පුවත්පත්, සහල්, පාන්

ClassWork.LK

2. සාප්පු භාණ්ඩ – Shopping Goods

භාණ්ඩවල මිල හා ගුණය සැසඳීමකින් තෝරා ගන්නා භාණ්ඩ සාප්පු භාණ්ඩ වේ. ඉතා ම සුදුසු මිල දී ගැනීමක් සඳහා පාරිභෝගිකයා නිතරම සැලකිලිමත් වේ. කාලයක් වැය කර මිල දී ගනී.

නිදසුන් :

විදුලි උපකරණ, ඇඳුම් පැළඳුම්, පාවහන්, ගෘහ භාණ්ඩ

3. විශේෂිත භාණ්ඩ – Speciality Goods

යම් භාණ්ඩයක් මිල දී ගැනීමට විශේෂිත උත්සාහයක් දරයි නම් එය විශේෂිත භාණ්ඩ වේ. පාරිභෝගිකයා තෘප්තිමත් වන්නේ මෙම විශේෂිත භාණ්ඩය පරිභෝජනය කිරීමෙන් පමණි. මේවායේ මිල ඉතා ඉහළ විය හැකි ය.

නිදසුන් :

ස්වර්ණාභරණ, මෝටර් රථ, පරිගණක, වෛද්‍ය නිර්දේශය සහිත බෙහෙත් වර්ග

ClassWork.LK

4. නොසෙවූ භාණ්ඩ - Unsought Goods

වෙළෙඳ පොළේ විකිණීම සඳහා ඇතිමුත් පාරිභෝගිකයා ඒ පිළිබඳ උනන්දුවක් නොදැක්වීම හෝ ඒ බව නොදන්නා භාණ්ඩ නොසෙවූ භාණ්ඩ වේ. මේවා පොදුවේ දැක්විය නොහැකි අතර පුද්ගලයාගෙන් පුද්ගලයාට නොසෙවූ භාණ්ඩ වෙනස් විය හැකි ය.

නිදසුන් :

ජීවිත රක්‍ෂණය ඔප්පු වර්ග, අලුත් පොත්

ClassWork.LK

කාර්මික භාණ්ඩ / ව්‍යාපාරික භාණ්ඩ -

Indurstril Goods / Business Goods

වෙනත් භාණ්ඩ නිපදවීම සඳහා යොදා ගනු ලබන භාණ්ඩ වේ. භාණ්ඩ නිෂ්පාදනය කිරීමට කාර්මික භාණ්ඩ මිල දී ගන්නේ බෙහෝවිට ව්‍යාපාරිකයන් බැවින් මේවාට ව්‍යාපාරික භාණ්ඩ යන නම යෙදේ. කාර්මික භාණ්ඩ යොදා නිපදවන්නේ පාරිභෝගික භාණ්ඩ විය හැකි ය. මෙම කාර්මික භාණ්ඩ ප්‍රධාන කොටස් තුනකින් යුක්ත වේ.

ClassWork.LK

කාර්මික භාණ්ඩ වර්ගීකරණය

1. ද්‍රව්‍ය හා කොටස් / අමතර කොටස් – Materials and parts

නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යෙදවුම් ලෙස එකතු කරන දෑ ද්‍රව්‍ය හා කොටස් නම් වේ.

නිදසුන් :

යකඩ, සිමෙන්ති වැනි ගෘහ නිර්මාන ආශ්‍රිත අමුද්‍රව්‍ය සහ ටයර්, මෙවලම් වැනි වාහන නිෂ්පාදිත උපාංග

2. ප්‍රාග්ධන අයිතම - Capital Items

වෙනත් භාණ්ඩ නිෂ්පාදනය කිරීම පිණිස නිෂ්පාදන ක්‍රියාවලියේ දී භාවිත වන දිගුකාලීන පැවැත්මක් ඇති නිමි භාණ්ඩ ප්‍රාග්ධන අයිතම වේ.

නිදසුන් :

කර්මාන්තශාලා ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර

ClassWork.LK

3. සැපයුම් හා ව්‍යාපාර සේවා – Supplies & Business Services

නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීමට උපකාර කරගන්නා, එහෙත් සාපේක්ෂව කෙටිකාලීන පැවැත්මක් ඇති භාණ්ඩ හා සේවා, සැපයුම් හා ව්‍යාපාර සේවා ලෙස හැඳින්වේ.

නිදසුන් :

- මෙහෙයුම් උපකරණ - ලිපිද්‍රව්‍ය, පැන්සල් හා පෑන්, ඇලපෙනෙති
- නඩත්තු සහ අළුත්වැඩියා සේවා - පිරිසිදු කිරීම, අළුත් වැඩියා කිරීම
- මූල්‍ය ව්‍යාපාර හා උපදේශන සේවා - මූල්‍ය සේවාවන්, නීති උපදේශක හා කළමණාකරණ උපදේශක සේවා, ප්‍රචාරණය

ClassWork.LK

නිෂ්පාදිත

අතීතයේ දී නිෂ්පාදිත භාණ්ඩ හා සේවා ලෙස වර්ග කරනු ලැබුව ද, වර්තමානයේ පුද්ගල වුවමනා සංකීර්ණ වීම නිසා නිෂ්පාදිතවලට විවිධ අයිතම එක් වෙමින් පවතී. ඒ අනුව, නිෂ්පාදිත පුළුල් පදනමක් මත පහත දැක්වෙන සේ ඉදිරිපත් කළ හැකි ය.

නිෂ්පාදිත, පුළුල් පදනමක් මත…

- භාණ්ඩ
- සේවා
- ඉසවු / සිද්ධි
- අත්දැකීම්
- පුද්ගලයෝ
- ස්ථාන
- සංවිධාන
- දේපල
- තොරතුරු
- අදහස්

ClassWork.LK

- **<u>භාණ්ඩ</u>**

මිනිස් වුවමනා සපුරාලන භෞතික පැවැත්මක් සහිත ස්පෘශ්‍ය දෑ භාණ්ඩ වේ.

නිදසුන් :

- ගෘහ භාණ්ඩ
- යන්ත්‍රෝපකරණ
- ඇඳුම්

- **<u>සේවා</u>**

මිනිස් වුවමනා ඉටු කරනු ලබන අස්පෘශ්‍ය දෑ එනම් පාර්ශ්වයක් විසින් තවත් පාර්ශ්වයක් සඳහා ඉදිරිපත් කළ හැකි ක්‍රියාවක් හෝ ක්‍රියාකාරකම් සේවා හෝ වේ.

නිදසුන් :

- ව්‍යාපාර රක්ෂණය
- ව්‍යාපාර බැංකු කටයුතු කිරීම
- ව්‍යාපාර ප්‍රවාහණ සේවා පවත්වාගෙන යාම

ClassWork.LK

- **අදහස්**

වෙළෙඳ පොළට ඉදිරිපත් කරන නිෂ්පාදිත පිළිබඳ ව නිෂ්පාදකයා තුළ හටගන්නා අලෙවි කළ හැකි ආකාරයේ සිතිවිල්ල, අදහසක් ලෙස දැක්විය හැකිය.

නිදසුන් :

- ''කෑමට පෙර මිනිත්තුවක් අත් සේදීම''
- '' ශ්‍රී ලංකා ළිපගිනි සැපයුම''

- **ඉසව්**

මිනිස් වුවමනා තෘප්තිමත් කිරීම හා සම්බන්ධ විවිධ අවස්ථා ඉසවු වේ.

නිදසුන් :

- ඔලිම්පික් ක්‍රීඩා උලෙළ
- වාර්ෂික සන්දර්ශන
- අන්තර් ජාතික වෙළෙඳ ප්‍රදර්ශන
- BMICH පොත් ප්‍රදර්ශනය (සාහිත්‍ය මාසය තුළ)

ClassWork.LK

▪ **පුද්ගලයෝ**

මිනිස් වුවමනා තෘප්තිමත් කිරීම සඳහා ඉදිරිපත් වන සුවිශේෂ හැකියා සහිත පුද්ගලයෝ වෙති.

නිදසුන් :

- මයිකල් ජැක්සන් (ගීත ගායනය)
- මිස්ටර් බීන් (විකට නළු)

▪ **අත්දැකීම්**

යම් කිසි කාර්යක් සඳහා පුද්ගලයකු ලබා ඇති විශේෂඥ දැනුම තවත් ගනුදෙනුකරුවකුට අලෙවි කිරීම අත්දැකීම් වේ.

නිදසුන් :

- දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයකු ක්‍රිකට් පුහුණු කරුවෙකු ලෙස ක්‍රියා කිරීම
- කඳු නැගීම පිළිබඳ අත්දැකීම් ඇති පුද්ගලයකු නවක කඳු නගින්නන්ට පුහුණුවක් ලබා දීම.

ClassWork.LK

- **ස්ථාන**

පුද්ගලයන්ගේ වුවමනාවන් තෘප්තිමත් කිරීමට හැකි විවිධ තැන්, ස්ථාන වේ.

නිදසුන් :

- සීගිරිය
- හුම්මානය
- ලෝකාන්තය

- **සංවිධාන**

මිනිස් වුවමනාවන් තෘප්තිමත් කිරිම සඳහා මිනිසුන් විසින්ම ඇති කර ගනු ලබන ඒකක බිහි කර ඇති සංවිධාන ඒකක, සංවිධාන වේ.

නිදසුන් :

- කාය වර්ධන සමාජ
- රතුකුරුස සංවිධානය
- YMBA/ YMCA/ YMHA
- ක්‍රීඩා සමාජය

ClassWork.LK

▪ දේපල

අයිතිය ප්‍රකාශ කරමින් හුවමාරු වන වත්කම් සම්බන්ධ ලියවිලි වර්ග මේ යටතේ දැක්විය හැක.

නිදසුන් :

- සාමාන්‍ය කොටස් බලපත්‍ර
- භාණ්ඩාගාර බිල්පත්
- ඉඩම් ඔප්පු

▪ තොරතුරු

පුද්ගලයන්ට තීරණ ගැනීමට ප්‍රයෝජනවත් වන පරිදි දත්ත සැකසීම මඟින් තොරතුරු බිහි වේ. ව්‍යාපාරික කාර්යයේ දී වුවමනා ඉටු කර ගැනීමට තොරතුරු ප්‍රයෝජනයට ගනී.

ClassWork.LK

නිෂ්පාදිත මිශ්‍රය

කිසියම් විකුණුම්කරුවකු විකිණීමට ඉදිරිපත් කරන නිෂ්පාදිත කළඹ නිෂ්පාදිත මිශ්‍රය ලෙස හඳුන්වයි. සමහර ආයතන එක් භාණ්ඩ අයිතමයක් පමණක් වෙළෙඳ පොළට ඉදිරිපත් කරන අතර සමහර ආයතන නිෂ්පාදිත කළඹක් ඉදිරිපත් කරයි. ආයතනයක නිෂ්පාදිත මිශ්‍රය පළලකින් දිගකින් ගැඹුරකින් හා සංගත භාවයකින් සමන්විත වේ.

නිෂ්පාදිත මිශ්‍රයක අංග

- පළල - ආයතනය සතු නිෂ්පාදන පෙළවල් ගණන වේ.
- දිග - සියලු ම භාණ්ඩ පෙළවල අන්තර්ගත නිෂ්පාදිත ගණන වේ.
- ගැඹුරු - එක නිෂ්පාදිත වර්ගයක් යටතේ ඉදිරිපත් කරන අයිතම සංඛ්‍යාව
- සංගත භාවය - භාණ්ඩ වර්ග අතර ඇති සම්බන්ධතාව

ClassWork.LK

නිදසුන :

<table>
<tr><td>කිරි පැකට්ටු</td><td colspan="3">අයිස් ක්‍රීම්</td><td colspan="5">චොකලට්</td></tr>
<tr><td>අයිස් ක්‍රීම්</td><td>වැනිලා</td><td>චොකලට්</td><td colspan="4">ස්ට්‍රෝබෙරි</td><td colspan="2">පලතුරු</td></tr>
<tr><td rowspan="2">බීම වර්ග</td><td rowspan="2">අඹ</td><td colspan="3" rowspan="2">දොඩම්</td><td colspan="4">මිශ්‍ර පලතුරු</td></tr>
<tr><td>750ml</td><td colspan="2">375ml</td><td>345ml</td></tr>
</table>

පළල - 3 (කිරි පැකට්ටු, අයිස් ක්‍රීම්, බීම)

දිග - 9 (කිරි පැකට්ටු 2, අයිස්ක්‍රීම් 4, බීම 3)

ඉහත බීම පෙළෙහි ප්‍රමාණ තුනකින් යුක්තව නිෂ්පාදිත ඉදිරිපත් කළ ඇති හෙයින් එහි ගැඹුර 3කි.

සංගත භාවය - ඇත. ඉහත සියලු ම නිෂ්පාදිත අතර කිරි පැකට්ටු හා බීම යන ඒවා පාන වර්ග වේ.

ClassWork.LK

නිෂ්පාදිත මට්ටම් / පාරිභෝගික වටිනාකමේ ධූරාවලිය

1. හර ප්‍රතිලාභය - Core Benefit

මූලික ප්‍රතිලාභය හර ප්‍රතිලාභය ලෙස ද සැලකෙන මෙය නිෂ්පාදිතයක පළමු මට්ටමයි. නිෂ්පාදිතයකින් ලබා දෙන ප්‍රධානතම ප්‍රයෝජනය යි.

නිදසුන් :

කාබන් පෑනක් මිල දී ලිවීම සඳහා ය.

2. මූලික නිෂ්පාදිතය - Basic Product

මෙය නිෂ්පාදිතයක දෙවන මට්ටමයි. මෙහි දී හර ප්‍රතිලාභය මූලික නිෂ්පාදිතයක් බවට පත් වේ.

නිදසුන් :

පෑනක් කාබන් කූර සහිත තුඩ, කොපුව, තීන්ත සහිත බටය ආදියෙන් සමන්විත විය යුතු ය.

ClassWork.LK

3. අපේක්ෂිත නිෂ්පාදිතය - Expected Product

ගැනුම්කරු අපේක්ෂා කරන අංග ලක්ෂණ සහිතව නිෂ්පාදිතය ඉදිරිපත් කිරීමයි. මෙය නිෂ්පාදිතයේ තෙවන මට්ටමයි.

නිදසුන් :

කාබන් පෑනක් නොකැඩී හොඳින් ලියවීම, බොඳ නොවීම, පැහැදිලි බව, දිගු කාලයක් පැවතීම, කාබන් උතුරා නොයන ලෙස ඉදිරිපත් කිරීම

4. වැඩි දියුණු කළ නිෂ්පාදිතය - Augmented Product

ගනුදෙනුකරු අපේක්ෂා කරන මට්ටමටත් වඩා ඉහළ මට්ටමක් සහිතව නිෂ්පාදිතය වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීම මෙහි දී සිදු කෙරේ. මෙය නිෂ්පාදිතයේ හතරවන මට්ටමයි.

නිදසුන් :

කාබන් පෑන ලියවෙන විට ප්‍රසන්න සුඳවක් වහනය වීම.

ClassWork.LK

5. විභව නිෂ්පාදිතය - Potential Product

ගනුදෙනුකරුට අනාගතයේ දී අවශ්‍ය විය හැකි යැයි සිතා නිෂ්පාදිතය සැලසුම් කිරීමේ දී අංගයන් එකතු කිරීම මඟින් විභව වෙළෙඳ පොළට පිවිසීම යි. මෙය නිෂ්පාදිතයේ පස්වන මට්ටමයි.

නිදසුන් :

- වර්තමානයේ කාබන් පෑනට වඩා දියුණු මට්ටමක පෑනක් ඉදිරිපත් කිරීම.

- ලියනවිට සංගීත රාවයක් පැතිරීම කාබන් අවසන් වීමට ප්‍රථම ඒ බැව් දැන්වීමට සංඥා නිකුත් කිරීම.

ClassWork.LK



නිෂ්පාදිතයක ජීවන චක්‍රයේ ප්‍රධාන අදියර

නිෂ්පාදිතයක (භාණ්ඩයක) ජීවන චක්‍රයේ (Product Life Cycle) ප්‍රධාන අදියර 05ක් පවතී.

1. භාණ්ඩ සංවර්ධන අදියර - Product Development Stage
2. හඳුන්වා දෙන අදියර - Introduction Stage
3. වර්ධන අදියර - Growth Stage
4. පරිණත අදියර - Maturity Stage
5. පිරිහීමේ අදියර - Decline Stage

ClassWork.LK

1. භාණ්ඩ සංවර්ධන අදියර

භාණ්ඩ සංවර්ධන අදියර ආරම්භ වන්නේ නව භාණ්ඩය පිළිබඳ අදහස් උත්පාදනයත් සමඟය. මෙම අදියරෙහි දී විකුණුම් නොමැති අතර පර්යේෂණ හා සංවර්ධන වියදම් දරයි.

2.හඳුන්වා දෙන අදියර

හඳුන්වා දෙන අදියරෙහි දී භාණ්ඩය වෙළෙඳ පොළට ඉදිරිපත් කරන අතර විකුණුම් හා ලාභය සෙමින් වැඩි වේ.

3. වර්ධන අදියර

වර්ධන අදියරෙහි විකුණුම් ඉහළ යන නිසා ලාභාංතිකයක් ද දක්නට ඇත.

ClassWork.LK

4. පරිණත අදියර

පරිණත අදියරෙහි වෙළෙඳ පොළෙහි භාණ්ඩය පිළිගෙන අවසන්ය. විකුණුම් හා ලාභ ස්ථාවරයි. වර්ධනය සෙමින් සිදුවන අතර තරගය ඉහළ යාම නිසා සෙමින් විකුණුම් හා ලාභ අඩුවීම ද අවසාන කාලයේ සිදු වේ.

5. පිරිහීමේ අදියර

පිරිහීමේ අදියරෙහි විකුණුම් පහළ යයි. ලාභය හීන වෙයි.

ClassWork.LK

භාණ්ඩයක ජීවන චක්‍රය

භාණ්ඩයක ජීවන චක්‍රයක විවිධ අදියර සඳහා විවිධ වූ අලෙවිකරණ අරමුණු සහ උපක්‍රම පෙන්නුම් කරනු ලබන අතර පොදුවේ ගත් කළ භාණ්ඩයක ජීවන චක්‍රය නැමති න්‍යායාත්මක සංකල්පය පහත සඳහන් උපකල්පන මත ගොඩනගා ඇත.

භාණ්ඩයක ජීවන චක්‍රය ගොඩනගා ඇති උපකල්පන

- නිෂ්පාදිතයකට නිශ්චිත ආයු කාලයක් ඇත.
- නිෂ්පාදිතයක් අලෙවිකරුවාට වෙනස් වෙනස් අභියෝග ගෙන දෙන විවිධ අදියර කීපයක් පසු කරයි.

ClassWork.LK

- භාණ්ඩයක ජීවන චක්‍රයෙහි විවිධ අදියරවල දී විකුණුම් හා ලාභය වෙනස් වේ.

- නිෂ්පාදිතයක ගමන් කරන එක් එක් අදියරේ විවිධ ස්වරූප අනුව අලෙවිකරුවා විසින් ඊට අදාළ අලෙවිකරණ අරමුණු හා උපාය මාර්ග අනුගමනය කරයි.

ClassWork.LK

භාණ්ඩයක ජීවන චක්‍රය ප්‍රස්තාරගත කිරීම.



Class Work.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති
(English & Sinhala Medium)

0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura